M891

11 AUG 2015

# සේවා වියුක්තියට පිළියමක් ලෙස ස්ථාපිත කර ඇති ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ (NAITA) ආධුනිකයන්ට ලබා දෙන වෘත්තීය පුහුණුවේ අදාළත්වය පිළිබඳ විමසීමක්

ඩබ්ලිව්.කේ. ලලිතා

ශාස්ත්‍රවේදී (BA) අධ්‍යාපන ඩිප්ලෝමා (PGDE) අධ්‍යාපන පති (M.Ed)

2008/M.phil/09

University of Colombo Library Sri Lanka

UCLIB

586096

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයට ඉදිරිපත් කරන නිබන්ධය - 2015

# සංක්ෂිප්තය

සේවා වියුක්තියට පිළියමක් ලෙස ස්ථාපිත කර ඇති ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ ආධුනිකයන්ට ලබා දෙන වෘත්තිය පුහුණුවේ අදාළත්වය යන මාතෘකාව ඔස්සේ පර්යේෂණය මෙහෙයවන ලද වත්මන් තරඟකාරී හා තාක්ෂණික ක්ෂෙත්‍රයේ උත්පාදනය වන රැකියා සම්බන්ධව අවබෝධයක් නොමැතිකමින් පාසල් අධ්‍යාපනයෙන් පසු අතිවිශාල ශිෂ්‍ය පිරිසක් විරැකියාවෙන් පසුවේ. උසස් අධ්‍යාපනයට ප්‍රවිශ්ට නොවන සිසුන්ගෙන් යම් ප්‍රමාණයක් පුහුණු ශ්‍රමිකයෙකු ලෙස රැකියා ක්ෂෙත්‍රයට පිවිසීමේ අරමුණින් වෘත්තිය පුහුණු ආයතනවලට ඇතුළත්ව පුහුණුවීම්වල නිරත වේ. එවැනි තරුණ ප්‍රජාවට වත්මන් ශ්‍රම වෙළඳ පොළට අවශ්‍ය කුසලතා අත්පත් කර දිමට පවත්නා වෘත්තිය පුහුණු පද්ධතියේ කාර්යභාරය කොතෙක් අදාළ වේද ? යන්න මෙම පර්යේෂණයෙන් විමසා බැලේ.

අධ්‍යයන අරමුණු 4ක් ඉටු කර ගැනිමට ඉහත පර්යේෂණය ක්‍රියාත්මක කෙරිණි . නයිටා හි පුහුණු ආයතනවල ඉගැන්වීමේ ක්‍රමවේද, පාඨමාලාවේ යෝග්‍යතාව පිළිබඳ සිසුන්ගේ ආකල්ප විමසා බැලිම, පාසල් හැර යන සිසුන් පුහුණු ශ්‍රමිකයකු බවට පත් කිරීමේදී වෘත්තිය පුහුණු ආයතනයක අදාළත්වය විමසා බැලිම, පුහුණු පාඨමාලාවන් නිමවූවන් සහ සේවා නියුක්තිය අතර සබඳතාව විමසා බැලිම සහ පුහුණු කාලසීමාවේදී ආධුනිකයන් මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීම එකී සුවිශේෂී අරමුණු වේ.

පර්යේෂණයේ මූලික පසුබිම සකස් කර ගැනිම සඳහාත් පර්යේෂිකාවට පර්යේෂණය පිළිබඳ පෘථුල වැටහිමක් ලබා ගැනිම සඳහා දෙස් විදෙස් පර්යේෂකයන් වෘත්තීය පුහුණුව යන ක්ෂෙත්‍රයට අදාළව කර ඇති අනාවරණ අදාළ සාහිත්‍ය විමර්ශනය තුළින් රැස්කර ගන්නා ලදි.

පර්යේෂණ කාර්යය සාර්ථකව නිම කර ගැනිම සඳහා නයිටා ආයතනයේ ජාතික මධ්‍යස්ථානවල පුහුණුව ලබන ආධුනිකයන් 254ක්, පුහුණුව නිම කළ ශිල්පීන් 66ක්, නිළධාරීන් 27ක් සහ සේවායෝජකයන් 25ක්, ඇතුලුව 372ක් ප්‍රමාණයක් ඉලක්ක නියැදිය කර ගත් නමුත් පර්යේෂණයට ප්‍රතිචාර දැක්වූ සමස්ත නියැදිය 339ක් විය.

අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු ඉටු කර ගැනිම සඳහා විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යොදා ගනිමින් ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා ඇතුළුව අදාල මිණුම් උපකරණ භාවිත කර දත්ත රැස්කර ගන්නා ලද ප්‍රතිශත, වගු, ප්‍රස්තාර සහ සරල සංඛ්‍යාන ක්‍රම භාවිතයෙන් රැස් කර ගත් දත්ත විශ්ලේෂණය සහ අර්ථකථනය කෙරින.

මෙම අධ්‍යයනයෙන් එළඹි වැදගත් නිගමන ගණනාවක් විය. ඒ අතරින් පුහුණු ආයතනවල පවත්වා ගෙන යන විෂය නිර්දේශ, ඉගැන්වීම් ක්‍රමවේද කෙරෙහි සිසුන් දක්වන ආකල්ප වලට වඩා ධනාත්මක නැඹුරුවක් ආයතනයේ භෞතික හා මානව සම්පත් වාතාවරණය කෙරෙහි සිසුන් තුල පවතී. නයිටා හි ජාතික මධ්‍යස්ථානවල ශිෂ්‍ය ප්‍රවේශයේ සැබෑ ජාතික නියෝජනයක් නොපෙන්වන අතර, බස්නාහිර පළාතේ පාසල් හැර යන සිසුන්ට විශේෂ පුහුණු අවස්ථා හිමිව ඇත. නයිටා හි ජාතික මධ්‍යස්ථානවලින් ලබා දෙන පුහුණුව ශ්‍රම වෙළඳපොළට ඉලක්ක ගත වුවද නවීන තාක්ෂණික ක්ෂේත්‍රයේ රැකියාවලට ප්‍රමාණවත් නොවන අතර පුහුණුව නිමවුවන්ට රැකියා වෙළඳපොළට ප්‍රවිශ්ට වීමේදි දැඩි තරගයකට මුහුණ දිමට සිදු වී ඇත. වෘත්තිය පුහුණු ක්ෂේත්‍රයට වැදගත් කරුණු කිහිපයක් පර්යේෂණයේ අවසානයේ දැක්වේ. ඒ අතර විෂය නිර්දේශ සහ ඉගැන්වීමේ ක්‍රමවේද තිරණය කිරිමේදී වෘත්තිය පුහුණු ආයතන අතර සිරස් හා තිරස් ආකාරයට සන්නිවේදනයට පහසු සම්බන්ධතා ජාලයක් ගොඩ නගා ගැනිම මගින් ජාතික ආර්ථිකයට යෝග්‍යතම වනසේ කාර්යක්ෂම හා ඵලදායි ලෙස පුහුණු වැඩසටහන් වෙනසකට ලක් කල හැකිය. වත්මන් ශ්‍රම වෙළඳපොලට යෝග්‍ය ලෙස පාඨමාලා හා පුහුණු ක්‍රමවේද ගලපා ගැනිමට නිසි ක්‍රමවේදයක් සැකසිම සඳහා වෘත්තිය පුහුණු ප්‍රතිසංවිධාන පද්ධතියක් ස්ථාපිත කළ යුතු අතර, එම කාර්යය දේශිය හා විදේශිය පුහුණු විශේෂඥයන්ගේ අධීක්ෂණයට ලක් කළ යුතය. පුහුණු ආයතන හා සේවායෝජකයන් අතර විධිමත් සම්බන්ධතා ජාලයක් ගොඩ නගා ගැනිමෙන් පුහුණු ශිල්පීන්ගේ විරැකියාව අවම කර ගැනිමට ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙලක් හඳුන්වා දිය යුතුය. වෘත්තීය පුහුණු ආයතන සංවර්ධනය සඳහා අනාගත පර්යේෂකයන්ට පර්යේෂණ කාර්යයේ නියැලිමට වඩා උචිත ක්ෂේත්‍ර පිළිබදව යෝජනා දැක්විමද පර්යේෂණය අවසානයේ සිදු කර ඇත.

# Abstract


The research was conducted under the topic of the vocational training which is being given by the NAITA that has been established as a solution to the unemployment problem.

At present huge number of young people stay unemployed after finishing their schooling since they are not given enough employment opportunities due to lack of knowledge of the vocational field. They expect only the prevailing professions in which everyone engaged. Certain magority of the students who do not get the higher education get the long term as well as short term training at the vocational training centre with the purpose of being employed in the job market as well trained employers .

The responsibility of the system of vocational training is to making the trainers talented and skillful. It is the major purpose of this research. This research has been implemented in order to achieve four specific objectives. They can be identified as below.

Asking about the students' opinions on the teaching methods brought into being in the NAITA and the appropriation of those courses, discussing about the use of a trained employees once they left their schools, discussing the relations between trainers those who completed the training course and employment, Identifying the problems that the amateurs who have to face during the training period.

The research related to the stream of vocational training that been launshed by the national and foreign experts have been included this research gathering the information taken through relevant literary analysis. Through 254 amateurs 66 well trained trainers, 25 employees and 27 officers the sample in NAITA were targetted in order to make the research success.

To achieve specific objectives descriptive research method were used. Collected data including questionnaires, interviews by utilizing the relevant measuring tools. Data was analysed and defined by using pie charts, graphs and simple statistic methods .

A number of conclusions could be identified once the research terminated. The students have a positive attitude on condition of human and physical resources that can be

seen then the teaching method in the training centers. A national representation cannot be seen in the admission of students at NAITA, but majority of students who left their schools in Western province are offered opportunities to enter the training centers. The training given by the National training centers is focused on the job market but that is not sufficient for being employed in a job market, where modern technology is used.

Suggestions were as follow. When deciding the teaching methods and syallbus change can be made in the training programmers by establishing a hub of communication among vocational training centers which benefits in creating an efficient and effective economy in a country. Therefore the course and training methods should be selected according to the demand of the prevailing job market . A vocational training re-establishment system should be set up and it must be inspected by well trained national and foreign experts so as to see expected successful results. A policy has been introduced to reduce the unemployment by creating a steady relationship between the training centers and the employers. The quality of this vocational training field can be enhanced by taking the suggestions mentioned above into action. This suggestions that help the future researchers to engage in the research work.